# ලංකා බැංකුව

## ශ්‍රී ලංකාවේ අංක 1 බැංකුව හා එක්ව ඔබේ නීති වෘත්තිය ගොඩනගා ගන්න!

බැංකුවේ නීති අංශයේ වෘත්තියක් කර ඉත් ඉදිරියට යාමට අපේක්ෂාකරන සුදුසුකම්ලත්, තරුණ, උද්‍යෝගිමත් අරමුණු වෙත හඹායන පුද්ගලයන්ගෙන් පහත දැක්වෙන තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## අභ්‍යාසලාභී සහකාර නීති නිලධාරී

(විශේෂයෙන්ම අනුරාධපුර, පොළොන්නරුව සහ කෑගල්ල යන ප්‍රදේශවල පුරප්පාඩු පවතී)

### ප්‍රධාන වගකීම්

- නිශ්චල දේපළවල හිමිකම් පරීක්ෂා කිරීම
- උකස් බැඳුම්කර සහ අදාළ වෙනත් ඔප්පු සහ ලේඛන කෙටුම්පත් කිරීම සහ සහතික කිරීම
- නීති මූලධර්ම මත පදනම්ව උපදෙස් සහ අදහස් ලබාදීම
- අධිකරණවල පෙනී සිටීම, නඩු කටයුතු සම්බන්ධයෙන් පැමිණිලි, මෝසම් සහ අදාළ වෙනත් ලේඛන කෙටුම්පත් කිරීම

### යෝග්‍යතා නිර්ණායක

- **ශ්‍රී ලාංකිය පුරවැසියකු විය යුතුය.**
- **සුදුසුකම්**

  ඉංග්‍රීසි සහ සිංහල/ දෙමළ භාෂා දෙකෙන්ම වෘත්තියේ නියැලීමට බලපත්‍රයක් සතුවන නීතිඥයකු සහ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු වීම

- **පළපුරුද්ද**

  අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 3ක පශ්චාත් සුදුසුකම් ලැබීමේ පළපුරුද්ද.

  බැංකු හෝ වෙනත් මූල්‍ය ආයතනවල පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත.

- **වෙනත් සුදුසුකම්**
  - පරිගණක සාක්ෂරතාව සහ සුවිශේෂී සන්නිවේදන කුසලතා
  - ස්වාධීනව වැඩ කටයුතු කිරීමේ හැකියාව
- **වයස**

  අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 30ක් හෝ ඊට අඩු විය යුතුය.

### නියමයන් සහ කොන්දේසි

- පුහුණු කාල සීමාව වසර දෙකක් (02) වන අතර පුහුණු කාලය තුළ (පළමු වසර සඳහා – මසකට රු. 90,000/– බැගින් හා දෙවන වසර සඳහා – මසකට රු. 100,000/– බැගින්) මාසික දීමනාවක් ගෙවනු ලැබේ.
- මෙම තනතුර බැංකු සේවයෙහි සාමාන්‍ය නියමයන් හා කොන්දේසිවලට යටත් වන නමුදු සාමාන්‍ය බැංකු ක්ෂේත්‍රයට පරිබාහිර (සංවෘත සේවය) වේ.
- පුහුණු කාලය අවසානයේදී බැංකුව විසින් පවත්වනු ලබන විශේෂ විභාගයකදී සුදුසු බව පෙනී ගියහොත් සහ පුහුණු කාලය තුළ සාමාන්‍ය හැසිරීම සතුටුදායක නම්, ස්ථිර කාර්ය මණ්ඩලයේ සහකාර නීති නිලධාරී ශ්‍රේණියේ ස්ථිර කරනු ලැබේ.
- කාර්යාල වේලාවට අමතරව අවශ්‍ය වූ විට සති අන්තයේ/නිවාඩු දිනවල සේවයෙහි යෙදීම අපේක්ෂා කෙරේ.
- බැංකුවේ අවශ්‍යතාව අනුව දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් විය යුතුය.
- විශේෂ ප්‍රදේශ (අනුරාධපුර, පොළොන්නරුව සහ කෑගල්ල) සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන් සතුව අදාළ අධිකරණ බල ප්‍රදේශය සඳහා ඔවුන්ගේ නොතාරිස් බලපත්‍ර තිබිය යුතුය.

### තෝරාගැනීමේ පටිපාටිය

ලැයිස්තුගත කරනු ලබන (shortlisted) අපේක්ෂකයන් සඳහා පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.

### අයදුම් කිරීමේ පටිපාටිය

අපගේ වෙබ් අඩවිය වන www.boc.lk (“careers” තීරය) යටතේ බාගත හැකි ආදර්ශ අයදුම්පත භාවිතයෙන් සකසන ලද ඔබගේ ජීවදත්ත පත්‍රිකාව, උප්පැන්න සහතිකයේ, ජාතික හැඳුනුම්පතේ, අදාළ සියලුම අධ්‍යාපනික සහතිකපත්වල සහ ඔබේ පළපුරුද්ද සනාථකිරීමේ සහතික/ ලේඛනගත සාක්ෂිවල ඡායාස්ථ පිටපත් සමග 2024 ජූලි මස 27 වන දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු අතර අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඔබ අයදුම් කරන ලද තනතුර ද සඳහන් කළ යුතුය.

*අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ඉහත නියමිත යෝග්‍යතා නිර්ණායක සපුරා නොමැති හෝ අදාළ සනාථකිරීමේ ලේඛනවල ඡායාස්ථ පිටපත් නොමැතිව හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත්කරන හෝ අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව එවන ඕනෑම අයදුම්පතක් කිසිදු දැනුම්දීමකින් තොරව බඳවා ගැනීමේ ඕනෑම අදියරකදී ප්‍රතික්ෂේප කරනු ලැබේ.*

**ප්‍රධාන කළමනාකරු (බඳවාගැනීම් හා වෘත්තීය සංවර්ධන)**
**ලංකා බැංකුව, 26 වන මහල - ප්‍රධාන කාර්යාලය,**
**"ලංකා බැංකු චතුරශ්‍රය"**
**අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 01.**

- බැංකුව වෙත කුමන අයුරකින් හෝ බලපෑමක් කිරීම ඔබ මෙම තනතුර සඳහා වහාම නුසුදුසු බවට පත්කිරීමට හේතුවේ.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුය.
- සම්පූර්ණ කළ යුතු තනතුරු සංඛ්‍යාව හෝ බඳවාගැනීම කල්දැමීමේ/ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.
- බැංකුවේ පෞද්ගලික දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුව, බැංකුව විසින් ඔබේ තොරතුරුවල පෞද්ගලිකභාවය හා රහස්‍යභාවය ආරක්ෂා කරනු ලැබේ.

1975 BOC CALL CENTRE
www.boc.lk
A (lka) Fitch ශ්‍රේණිගත කිරීම AAA Brand Finance ශ්‍රේණිගත කිරීම.
ලංකා බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකුවකි.
ප්‍රධාන කාර්යාලය, BOC චතුරශ්‍රය, අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 1.
ලංකා බැංකුව BOC ජාතියේ මහා පහන් ටැඹ